# ක්ෂණවාදය හා ධර්මවාදය

මෙම ලිපිය ලිවීමේ නිමිත්ත මේ වෙසක් සතිය වීම බව අමුතුවෙන් කිවයුතු නො වෙයි. එහෙත් ඒ ලියැවෙන්නේ අපේ මූලික දැක්ම පෙරදැරි කරගෙන ය. සිංහල ථෙරවාද බෞද්ධ සංස්කෘතිය මත පදනම්ව නව දැනුම නිර්මාණය කිරීම හා අනෙක් දැනුම් පද්ධතිවලට, විශේෂයෙන් ම බටහිර දැනුමට, වෛදික දැනුමට හා මහායාන දැනුමට අභියෝගාත්මකව සිංහල ථෙරවාද සංස්කෘතියට හිමිතැන ලැබෙන අයුරින් ඒ කිරීම අපේ දැක්ම වෙයි. දෙමළ ජාතිවාදය පිළිබඳ අප ලියන කියන දෑ ද ඒ දැක්ම පෙරදැරි කරගනියි.

මෙහි සඳහන් කරුණු ඇත්තේ මොන පොතේදැයි ඇතැම් පඬිවරයකු අසනු ඇත. පොත්වල ඇති කරුණු නැවත නැවත සෙවීමට (රිසර්ච් යන වචනයෙහි මුල් අර්ථය එය විය) හා ඒ ප්‍රකාශකිරීමට මගේ කැමැත්තක් නැත. අනෙක ඒ සඳහා බොහෝ උගත්තු පෙළ ගැසී සිටිති. මෙහි සඳහන් කරුණු පොතක නැත්නම් ඒ ගැන මම සතුටු වෙමි. බොහෝ විට පොත් ලියා ඇත්තේ ද අප වැනි ම වූ පෘථග්ජන පුද්ගලයන් ය. මේ මෙතෙක් ලියා ඇති පොත්වල නැති කරුණු ද ලිවීම සඳහා කාලයයි. අප කළ යුත්තේ සිංහල ථෙරවාද බෞද්ධ සංස්කෘතිය මත පදනම් වෙමින් අලුත් දැනුම නිර්මාණය කිරීම ය. එමගින් සිංහල ථෙරවාද බෞද්ධ සංස්කෘතිය ද වර්ධනය වනු ඇත. වෙනත් වචනවලින් කිවහොත් අප අද නැවතත් අටුවා ටීකා හා ටිප්පණි ද ලිය යුතු ය.

මාධ්‍යමිකයන් විසින් ථෙරවාදීන්ගේ ක්ෂණවාදය හා ධර්මවාදය ඛණ්ඩනය කෙරිණි. චිත්ත, චෛතසික, රූප, නිර්වාණ යනුවෙන් ධර්ම හතරක් ගැන අපේ සාහිත්‍යයෙහි සඳහන් වෙයි. අප නිර්වාණය පසෙකට දැමුවහොත් අනෙක් ධර්ම පවතින්නේ ද? අප පිළිතුරු දිය යුතු මූලික ප්‍රශ්නය එය යැයි සිතමි. මේ ධර්ම පවතින්නේ කිනම් කාලයකට ද? අපට ඒ ක්ෂණයක් යැයි කිවහැකි ය. අපි ඇතැම් විට චිත්තක්ෂණයක් ගැනත් රූපක්ෂණයක් ගැනත් කියමු. ඒ පිළිවෙළින් චිත්තයක් හා රූපයක් පවතින කාලය ය.

පවතින යන්නෙන් මෙහි දී අදහස් කෙරෙන්නේ කුමක් ද? ඕනෑම ධර්මයක් ඉපිදී පැවතී නැතිවන්නේ (උප්පාද තිථි භංග) යැයි අපි කියමු. ඇතැම් බෞද්ධයෝ තිථි යන තත්වය නැතැයි ගත්හ. ඔවුන්ට අනුව උප්පාද හා භංග පමණක් වෙයි. තිථිය හෙවත් පැවැත්ම පිළිගැනීම ප්‍රශ්නයක් වී ඇති බව පැහැදිලි ය. එහෙත් අපට ප්‍රශ්නයක් වන්නේ තිථිය පමණක් ද? උප්පාද හා භංග ද ප්‍රශ්න නොවන්නේ ද? ධර්මයක් ඉපදෙන්නේ ය හා නැතිවන්නේ ය යන්නෙන් ම වුවත් එවැනි ධර්මයක් ගැන කියැවෙයි. එලෙස ධර්ම ගැනීම අනාත්ම හා අනිත්‍ය සමග පෑහෙන්නේ කෙසේ ද?

මේ ප්‍රශ්න වැඩකට නැති ප්‍රශ්න යැයි ඇතැමකු කියනු ඇත. ඔවුන්ගෙන් සමහරකුට අනුව අප කළ යුත්තේ භාවනා කිරීම ය, අධ්‍යාත්මික ගුණය වගාකර ගැනීම ය. එහි වරදක් ඇතැයි අපි නො කියමු. එසේ වුවත් බටහිර ආත්මවාදී දැනුම මෙන් ම වෛදික ආත්මවාදී දැනුම ද පරාජය කිරීමෙහි දී අපට ඒ ප්‍රශ්න වැදගත් වෙයි. අප ඒ දැනුම් ඛණ්ඩනය කළ යුත්තේ ඇයි ද යන ප්‍රශ්නය ද කිසිවකුට ඇසිය හැකි ය. ඉතා කෙටියෙන් කිවයුත්තේ රටේ හා ලෝකයේ යහපත පිණිස එලෙස කළ යුතු බව ය. කොටි සංවිධානය හා ප්‍රභාකරන් පරාජය කළ නොහැකි ය යන මතය ඛණ්ඩනය කිරීමේ ප්‍රතිඵල අපි අද හෙට භුක්ති විඳිමු. එහි සම්පූර්ණ ජයග්‍රහණය ඇත්තේ දෙමළ ප්‍රශ්නය යනු බ්‍රිතානීන් ඇතිකර පවත්වාගෙන යන ප්‍රශ්නයක් බව තේරුම් ගැනීම මත ය.

ථෙරවාදීහු පුද්ගල ආත්මවාදය ප්‍රතික්ෂේප කළහ. එහෙත් ධර්මාත්මවාදය ප්‍රතික්ෂේප කිරීම ඔවුන්ට ගැටළුවක් විය. ථෙරවාදීන් මාධ්‍යමිකවාදයේ නිර්මාතෘ නාගර්ජුනපාදයන් වහන්සේගේ විවේචනයට හසුවූයේ මූලික ව මේ කරුණ මුල්කරගෙන ය. ධර්මයක් ඉපිදී පැවතී නැතිව යන්නේ නම් ඉන් කියැවෙන්නේ වෙනස්වන යමක් ඇති බව ය. අනිත්‍ය හා අනාත්ම යන්නෙන් වෙනස්වීමක් පමණක් ගැන නොකියැවෙයි. අනිත්‍ය යනු වෙනස්වීම පමණක් නම් අප සියලු දෙනාට ම මේ වන විට අනිත්‍ය අවබෝධ වී තිබිය යුතු ය. එහෙත් ඒ එසේ නොවන බව අප තවමත් සසර සැරිසැරීමෙන් පෙන්නුම් කෙරෙයි.

© Prof. Nalin De Silva

වෙනස්වීම යනු පවතින යමක් වෙනස්වීම නොවන බව පෙන්වීමට මහාවිහාරික භික්ෂූන් වහන්සේලාට හැකි වී ඇත. උන්වහන්සේලාට අනුව වෙනස්වීම යනු යමක් නැතිවී වෙනත් දෙයක් ඇතිවීම ය. වෙසක් සතියෙහි ප්‍රදර්ශනය කෙරෙන තොරණෙහි ආලෝකවැල් ගමන්කරනු අපි දකින්නෙමු. මේ ආලෝකවැල් එක් විදුලි බල්බයක සිට අනෙක් විදුලි බල්බයට ගමන්කරනු අපට පෙනෙයි. ගමන්කිරීම යනු වෙනස්වීමක් බව මෙහි දී පැහැදිලි විය යුතු ය. ආලෝකය එක්තැනක නොසිට වෙනත් තැනකට යෑම වෙනස්වීමකි. සමස්ත ගතිකය ම වෙනස්වීම මිස අනෙකක නො වෙයි.

ආලෝකය විදුලි බල්බයක සිට තවත් බල්බයකට ගමන්කරනු අප දකිතත් සිදුවන්නේ එක් බල්බයක් නිවී ගොස් වෙනත් බල්බයක් දැල්වීම ය. ඒ දෙවැනි බල්බය ද නිවී ගොස් තුන්වැනි බල්බයක් දැල්වෙයි. මෙසේ බල්බ අනුක්‍රමිකව දැල්වී නිවී යෑම අප දකින්නේ ආලෝකය බල්බ ඔස්සේ ගමන්කිරීමක් ලෙස ය. මහාවිහාරික භික්ෂූන්වහන්සේලාගේ වෙනස්වීම පිළිබඳ ප්‍රවාදය අපට එලෙස අද දවසේ නිදර්ශනයක් මගින් තේරුම් ගත හැකි ය. වෙනස්වීම යනු යමක් වෙනස්වීම නොවේ. එසේ කිවහොත් වෙනස්වන යමක පැවැත්ම, එනම් යමක් යනුවෙන් කිසිවක් පැවැත්ම අපි උපකල්පනය කරමු. ඒ ආත්මවාදී ය. අනිත්‍ය ආත්මවාදීව තේරුම් ගැනීමට නො හැකි ය. සියලු බටහිර විද්‍යාඥයෝ වෙනස්වීම ආත්මවාදීව තේරුම් ගනිති. නිව්ටන් හා අයින්ස්ටයින් ඒ අතර ප්‍රධාන වන බව අමුතුවෙන් කිවයුතු නො වේ. ඔවුන් කිසිවකුවත් අඩුම තරමින් සෝවාන් ඵලයටවත් නොපැමිණි බව පැහැදිලි ය. එහෙත් අපි බටහිර විද්‍යාඥයෙන්ගෙන් බුදුදහමට සහතික ලියවාගැනීමට තරම් දීන වෙමු.

මහාවිහාරික භික්ෂූන් වහන්සේ ථෙරවාද සම්ප්‍රදායෙහි කටයුතු කරමින් යමක් වෙනස්වන්නේ ය යන්න ප්‍රතික්ෂෙප කළහ. එහෙත් උන්වහන්සේලා වෙනස්වීම යනු ඇතිවී නැතිවන්නක් එලෙස ම ඇතිවී නැතිවී යන්නකින් ප්‍රතිස්ථාපනය වන බව දේශනා කිරීමෙන් තුන්වැනි ධර්ම සංගායනාවෙන් ථෙරවාදීනට උරුම වූ ක්ෂණවාදයට කරගැසූහ. ධර්මයක් ඇති වී නැතිවී යෑම යන්නෙහි ද යම් ආත්මවාදයක් වෙයි. ධර්මයක් යනුවෙන් යමක් ගැනීම, ඒ ඇති වී පැවතී නැතිවුවත්, අවසානයේ දී ආත්මවාදී වෙයි. ඒ පවතින්නේ ක්ෂණයකට පමණක් යැයි කීමෙන් ප්‍රශ්නය නො විසඳෙයි. මොහොතකට හෝ ධර්මයක් පවතින්නේ නම් ඒ මොහොත කෙතරම් කුඩා වුවත් එසේ පවතී යැයි ගැනීම ආත්මවාදි වෙයි. ක්ෂණය කුඩාපිරීමෙන් හෝ සෞත්‍රාන්තිකයන් මෙන් ඒ නැතිකිරීමෙන් හෝ අපට ප්‍රශ්නයෙන් මිදෙන්නට නො හැකි ය.

අප මේ ගැටලුවෙන් මිදෙන්නේ කෙසේ ද? මේ ධර්ම කිසිවක් පරමාර්ථ වශයෙන් නොගැනීමෙනි. නිවන හැරෙන්නට අනෙක් ධර්ම යනු මනසට ගතහැකි කුඩාම ධර්ම යනුවෙන් බෝධි ස්වාමින්වහන්සේ අභිධර්මාර්ථ සංග්‍රහයට ලියූ පෙරවදනෙහි සඳහන්කර තිබීම මෙහි දී අපට ප්‍රයෝජනවත් වෙයි. අපේ අවාසනාව අපට සංකල්පවලින් තොරව සිතන්නට බැරිවීම ය. සිතන්නට භාෂාවක් අවශ්‍ය යැයි ලකාන් වැනි කසිකබල් පශ්චාත්නූතනවාදී පඬියෝ කියති. මෙරට සිටින ඇතැම්හු මේ මත කිසිම වගවිභාගයක් නැතිව පුනරුච්චාරණය කිරීමෙන් තම අමනකම ප්‍රදර්ශනය කරති. මේ කසිකබල් මතයට අනුව මිනිසුන් භාෂා කතාකිරීමට පෙර සිතා නැත. මිනිසුන් භාෂා නිර්මාණය කෙළේ සිතා ද නැත් ද යනු ලකාන්වත් සිතා නැති බව පැහැදිලි ය. සිතන්නට අවශ්‍ය වන්නේ සංකල්ප ය. සංකල්ප චිත්තරූප ද විය හැකි බව භාෂා නොදන්නා ළදරුවන්ගේ ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීමෙන් දැනගත හැකි ය.

මේ සංකල්ප, ධර්ම ආදී සියල්ල මනසට සාපේක්ෂ වෙයි. කිසිදු ධර්මයක් පරමාර්ථ ලෙස අපෙන් තොරව, එනම් මනසින් තොරව නොපවතියි. පවතින්නේ යැයි කියන ධර්ම සංකල්පීය වෙයි. සංකල්ප ශූන්‍ය වෙයි. (නිවන ධර්මයක් හෝ සංකල්පයක් හෝ නො වේ යැයි කීම ද වැරදි ය) වෙනත් වචනවලින් කියන්නේ නම් සංකල්පීය ලෝකය ශූන්‍ය වෙයි. එහෙත් ථෙරවාදීන් වූ අපි මාධ්‍යමිකයන් මෙන් නොව ශූන්‍යතාවක් නො පිළිගනිමු. ශූන්‍ය හා ශූන්‍යතාව අතර ගුණයක හා නාම පදයක අතර ඇති වෙනස වෙයි. මාධ්‍යමිකවාදීන්ගේ ශූන්‍යතාව ද අවසාන වශයෙන් ගත්කල ආත්මවාදී බව එදා ථෙරවාදීන් පෙන්නුම් කෙළේ නම් මහායාන මෝහය නියපොත්තෙන් කඩාදැමීමට තිබුණි. නිවන හැරෙන්නට අනෙක් ධර්ම මනසට සාපේක්ෂ වෙයි. මනස ගොරහැඩි ය. එයට ගතහැකි කුඩා ම කාලයක් වෙයි. ඒ බටහිර විද්‍යාවෙහි කියැවෙන ප්ලෑන්ක් කාලයට ද වඩා අඩු යැයි සිතමි. ගොරහැඩි මනස ගන්නා කුඩාම කාලය චිත්තක්ෂණය වෙයි. ධර්ම, සංකල්ප යනු මේ ගොරහැඩි මනස නිර්මාණය කරන දෑ පමණ ය. එවිට මනස නිර්මාණය කෙළේ දෙවියන් වහන්සේ ද? නැත, මනස ද මනසෙහිම නිර්මාණයක් වෙයි!

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva